# ශ්‍රී ලාංකික සංස්කෘතිය තුළ භාවිත ජ්‍යෝතිෂ්‍ය සංකල්පය හැදෑරීමට යොදාගත හැකි මූලාශ්‍ර පිළිබඳ විමසීමක්

**- ආධුනික කථිකාචාර්ය කුඩාවැවේ සෝමානන්ද හිමි**

සූර්යයා කේන්ද්‍ර කරගත් ශාස්ත්‍රය ජ්‍යෝතිෂ්‍යයයි. සූර්යයාගේ ආලෝකය මත දිවෙන ඍතු නියාම ධර්මය ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රයෙන් පිළිබිඹු වේ. පුරාතන ශ්‍රී ලාංකික සංස්කෘතිය තුළත් පෙරදිග චින්තනය විදහාපාන අනෙකුත් බොහෝ සංස්කෘතීන් තුළත් ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රීය පදනම බෙහෙවින්ම ඉස්මතුව පෙනෙයි. මුල්ම අවදියේ සිටම ලක්දිව භාරතයත් සමඟ පැවැති අඛණ්ඩ සබඳතාව මත බොහෝමයක් සංස්කෘතිකාංග මෙන්ම ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රීය සංකල්පය ද ලක්දිව කෙරෙහි බලපා ඇත. එසේ වුවද බෞද්ධාගමින් පෝෂිත සංස්කෘතියට ගැලපෙන අයුරින් ලක්දිව දී ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රය යොද ගන්නා බව පැහැදිලිව පෙනෙයි.

ප්‍රස්තුත මාතෘකාව සම්බන්ධයෙන් එනම් ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රය ලක්දිව දේශපාලන, ආගමික, සාමාජික, සංස්කෘතික ආදී ක්ෂේත්‍රයන් සඳහා කෙසේ බද්ධ වී ද යන්න අධ්‍යයනය කිරීමේ දී මූලාශ්‍ර සඳහා සුවිශේෂී වැදගත් කමක් හිමිවෙයි.

ඒ අනුව සාම්ප්‍රදායික වශයෙන් බෙදෙන පරිදි සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ද්විත්වයම වැදගත් යැයි කිව යුතුය. ඒ අනුව ප්‍රාථමික මූලාශ්‍ර ගණයට අයත්වන ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රය පිළිබඳව රචිත ඉන්දීය සහ ශ්‍රී ලාංකික කෘති ගණනාවක්ම ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රීය න්‍යායයන් පිළිබඳව අධ්‍යයනයටත් දේශීය භාවිතයන් පිළිබඳව සංසන්දනාත්මකව කරුණු ගෙනහැර



පෑමටත් බෙහෙවින්ම වැදගත්ය. **වෘහත්සංහිතා,**[1] **බෘහත්පරාශර හෝරා ශාස්ත්‍රය,**[2] **ලඝු ජාතකය,**[3] **ශම්භුහොරා ප්‍රකාශ,**[4] **භාවකුතුහලය,**[5] **මානසාගරි,**[6] **ජෛමිනි සූත්‍රය,**[7] **දෛවඥකාම ධෙනුව**[8] ආදී ජ්‍යෝතිෂ්‍ය ග්‍රන්ථ සඳහා බොහෝ වැදගත් කමක් හිමි වේ. එසේම ශ්‍රී ලාංකික සංස්කෘතියට බලපෑ ඉන්දීය ආභාසය පිළිබඳව විචාරාත්මක සහ සන්සන්දනාත්මකව අධ්‍යයනය කිරීමටත් මෙම ග්‍රන්ථ තුළින් ලැබෙන පිටිවහල ඉමහත්ය.

**බ්‍රහ්මස්ඵුට සිද්ධාන්ත** තාරකා ශාස්ත්‍රය පිළිබඳවත් නක්ෂත්‍රය පිළිබඳවත් රචනා කරන ලද ග්‍රන්ථයකි. බ්‍රහ්මස්ඵුට නැමැති මෙම ග්‍රන්ථය ක්‍රි. ව. හයවැනි සියවසේ දී බ්‍රහ්ම ගුප්ත නැමැත්තෙකු විසින් රචිතය. මෙම ග්‍රන්ථයට සමාන ආකාරයෙන් ලියූ ග්‍රන්ථයක් වන්නේ මොහුගේම **කරණ** නැමැති ග්‍රන්ථයයි.

භාස්කරාචාර්ය නැමැති ආචාර්යවරයා විසින් රචිත කෘතියක් වශයෙන් **සිද්ධාන්ත ශිරෝමණිය** දැක්වෙයි. මෙම ග්‍රන්ථය රචිත කාලය වශයෙන් දැක්වෙන්නේ දොළොස්වැනි සියවසය. ඉතා උසස් නක්ෂත්‍ර විෂයය සම්බන්ධ ග්‍රන්ථයක් වශයෙන් ද සැලකෙයි.

ශ්‍රී ධරාචාර්ය නැමැත්තෙකු විසින් දසවැනි සියවසේ දී රචනා කරන ලද්දක් වශයෙන් **ගණිත සාරය** සැලකේ. මෙම ග්‍රන්ථයෙහි අන්තර්ගත වන්නේ නක්ෂත්‍රය වර්ෂ සහ දින වකවානු ගණන් කරන අයුරුය.

ජනප්‍රිය කවි කාලිදාස නමින් යුත් පසුකල එනමින් සිටි කෙනෙකු විසින් **ජ්‍යොතිර්විධාභරණ** නම් කෘතිය රචනා කරන ලද බව සැලකේ. බෙහෙවින් සම්භාවනාවට ලක්වන කෘතියක් වන මෙය සම්පූර්ණ නක්ෂත්‍රය සම්බන්ධයෙන් මනාකොට තොරතුරු ගෙනහැර පාන්නකි.

ඉහතින් සඳහන් කරන ලද කෘති බොහෝ සෙයින්ම නක්ෂත්‍රය සහ තාරකා විද්‍යාව සම්බන්ධයෙන් රචිත උසස් ගණයට අයත් කෘති වශයෙන් සැලකේ. තවද මුඤ්ජලගේ **ලඝුමානය, හෝජරාජගේ රාජමාර්තණ්ඩ,** මානරාජගේ **සිද්ධාන්ත සුන්දර**

මකරන්ද නැමැත්තා විසින් රචිත **මකරන්ද**, ගණේශගේ **ග්‍රහලාඝව** මෙන්ම රාඝවානන්දගේ **සිද්ධාන්ත රහස්‍ය** ද මෙකී විෂය ක්ෂේත්‍රය අළලා ම රචනා කර ඇති තවත් ග්‍රන්ථයෝ වෙති.[9]

වරාහමිහිරගේ පුතෙකු වූ පෘථුයශස් නැමැත්තා **හොරාෂට්පඤ්ච ශිඛාව**[10] නැමැති කෘතියක් රචනා කළ අතර ඉන් උත්පත්තිය පිළිබඳව කරුණු ඇතුළත් වේ. මෙයට ද භට්ටොත්පල විසින් අටුවාවක් ලියන ලදි. මොහු ද පද්‍ය හැත්තෑ පහකින් යුක්ත හෝරා ශාස්ත්‍රයක් ලියුවේය. එසේම වශිෂ්ඨ, බෘහස්පති, ගාර්ග්‍ය සහ වෙනත් අය නීති ග්‍රන්ථ ලියා ඇත.11

එසේම කාලය පිළිබඳව නිශ්චිතව සඳහන් නොවූව ද **වෘද්ධ වාසිෂ්ඨ සංහිතාව** මෙන්ම හෂීකීර්තිසූරින්ගේ **ජෛන ජ්‍යොතිෂ සාරොද්ධාරය** වැනි කෘතීන් ද ගෙනහැර දැක්විය හැකිය. **ජ්‍යොතිර්විදාභරණය**[12] නැමැති කෘතියෙහි වික්‍රමාදිත්‍ය රජුගේ රාජසභාවේ සිටි නවරත්නයන් පිළිබඳ කරුණු ඇතුළත් වෙයි. පසුකල උත්සව, විවාහ, ගමන් බිමන් ආදිය සඳහා වූ සුබ නැකැත් දැක්වෙන්නා වූ ග්‍රන්ථ රාශියක් ද දක්නට ලැබේ. 'මුහුර්ත' යන පදය මෙම පොත්වල නමට මුලින් දක්වා ඇත. මහම්මදික පාලනය යටතෙහි අරාබි මෙන්ම පර්සියානු බලපෑම ඇති වූ අවස්ථාවෙහි තාජික ග්‍රන්ථ ඇති වූ බවක් පෙනෙයි. පර්සියානු තයිජ් 'අරාබි' යන වචනයෙන් මෙම නාමය යොදා තිබේ. 1587 දී ලියැවුණු නීලකණ්ඨගේ **තාජිකය** වර්තමානයේහි ද දක්නට ලැබේ.[13]

පසුකාලයෙහි බොහෝසෙයින්ම නිමිති කීම මෙන්ම සාස්තර කීම සම්බන්ධිත කෘතීන් රාශියක් ලියැවී තිබේ. **අද්භූත සාගරය**[14] නැමැති 1168 දී බල්ලාලසේන නැමැත්තා විසින් ලිවීමට ආරම්භ කළ අතර එය අවසන් කරන ලද්දේ ලක්ෂ්මණ සේන විසින්ය. 1160 දී **සමුද්‍රතිලකය** නම් කෘතිය ගුජරාඨයේ කුමාරපාල යටතෙහි සිටි නරසිංහගේ පුත්‍රයකු වුණු දුර්ලභ රාජ නැමැත්තා ලියන්නට ඇරඹුව ද ජගද්දේව නැමැති ඔහුගේ පුත්‍රයා විසින් එය අවසන් කරන ලදි. සිහින පිළිබඳව තොරතුරු ඇතුළත් **ස්වප්නචින්තාමණි**[15] නම් ග්‍රන්ථය ඔහු විසින්ම රචනා කළේය.



සටන් වැනි ක්‍රියාවන්හිත් නිර්භීත ක්‍රියාවන්හිත් අනාගත ඵල කීමට ගූඪාක්ෂරවලින් සලකුණු වූ මන්ත්‍ර රූප භාවිත කරන පිළිවෙල පිළිබඳව ධාරාවෙහි වාසය කරන ලද අමරදේව නැමැත්තෙකුගේ පුත්‍රයකු වශයෙන් සඳහන් වෙන නරහර නම් වූවකු ගුජරාඨයේ අජයපාලගේ 1174-7 ලියන ලද **නරපතිජයචය්‍යා ස්වරොදය**[16] නම් කෘතියෙහි ඇතුළත්ය. මෙම ශාස්ත්‍රය හා සම්බන්ධ තවත් කෘතියක් වන්නේ භයභඤ්ජනශර්මන්ගේ **රමලරහස්‍ය**[17] වන අතර පසු කල ලියැවුණු තවත් කෘති ද දක්නට ලැබේ.[18]

එසේම ශ්‍රී ලාංකික ඉතිහාසය අඛණ්ඩව ගෙනහැරපා ඇති වංසකථාත් අවශේෂ සාහිත්‍ය කෘතිත් මේ පිළිබඳව කරුණු අනාවරණය කරගැනීමට උපකාරී වේ. ඒ අනුව, ක්‍රි. ව. පස්වැනි සියවසට පෙර රචිත **දීපවංසයෙන්**[19] සහ **මහාවංසයෙන්**[20] ප්‍රස්තුත මාතෘකාව පිළිබඳවත් ශ්‍රී ලාංකික සමාජය සහ සංස්කෘතිය ආදී විවිධ ක්ෂේත්‍රයන් සම්බන්ධයෙනුත් තොරතුරු ගෙනහැර පෑමට වඩාත් උපකාරී වේ. **වංසත්ථප්පකාසිනී**[21] මහාවංස ටීකාවෙන් වංසකථාවල පමණක් නොව වෙනත් මූලාශ්‍රවල එන තොරතුරුත් විචාරාත්මකව ගෙනහැර පෑමට විශාල සහයක් ලබාදෙයි.

මේහැර පුරාතන ඉන්දියාවේත් ශ්‍රී ලංකාවේත් බෞද්ධ කතා ඇතුළත් සාහිත්‍ය කෘති හැටියට එන **රසවාහිනී**[22] ආදී ග්‍රන්ථ ද සඳහන් කළ හැකිය. ඒ තුළින් වෙනත් මූලාශ්‍රවල එන තොරතුරු සසඳමින් පුරාතන ශ්‍රී ලාංකික සංස්කෘතිය අධ්‍යයනය කිරීම උදෙසා ප්‍රයෝජනවත්ය.

තවද සාහිත්‍යය මූලාශ්‍ර ගණයට අයත්වන **සද්ධර්මරත්නාවලිය,**[23] **පූජාවලිය,**[24] **ධම්ප්‍රදීපිකාව,**[25] **බුත්සරණ,**[26] **දඹදෙණි අස්න** හා **කඳවුරු සිරිත,**[27] සංදේශ කාව්‍ය28 ආදී සම්භාව්‍ය කෘතීන් ද බෙහෙවින්ම උපස්ථම්භක වේ.

ක්‍රි. පූ. තුන්වැනි සියවසින් පසුව ලියන ලද අභිලේඛන දේශපාලනික මෙන්ම සංස්කෘතික ක්ෂේත්‍රයන් අධ්‍යයන කිරීමෙහි දී වඩාත් විශ්වසනීය ආකාරයෙන් යොදාගත හැකි

පුරාවිද්‍යාත්මක අංශයට ගැනෙන මූලාශ්‍රයි. ඒ අනුව ප්‍රස්තුත මාතෘකාව අළලා ප්‍රාථමික මෙන්ම ද්විතීයික මූලාශ්‍රයන් උපයෝගී කරගෙන පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර[29] සංසන්දනාත්මකව ගෙනහැර පාමින් ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රීය සංකල්පය ශ්‍රී ලාංකික සංස්කෘතියට බලපෑ ආකාරය පිළිබඳව නිගමනයන් කරා යොමුවිය හැකිය.

එසේම ජ්‍යෝතිෂ්‍ය විෂය සම්බන්ධයෙන් හැදෑරීමට පහත සඳහන් ග්‍රන්ථ ද යොදගත හැකිය. G. Thibaut විසින් 1930 දී සංස්කරණය කළ **The Panchasiddhantika The Astronomical Work of Varaha Mihira**[30] යන ග්‍රන්ථයෙන් සිද්ධාන්ත ග්‍රන්ථ පිළිබඳව තොරතුරු අනාවරණය කරගත හැකිය. එනම් සූර්ය සිද්ධාන්තය, පෛතමහ සිද්ධාන්තය, රෝමක සිද්ධාන්තය, පෞලිෂ සිද්ධාන්තය සහ වසිස්ත සිද්ධාන්තය යන ඒවා සම්බන්ධවය. තවද එම ග්‍රන්ථයන්ගේ ස්වභාවයත් ඒවායේ මූලික තොරතුරු පිළිබඳවත් කරුණු ඇතුළත්ය. 1950 දී රචිත **Chambers's Encyclopaedia**[31] Vol. I නැමැති විශ්වකෝෂයෙහි ජ්‍යෝතිෂ්‍ය සම්බන්ධ කොටසෙහි පෙරදිග හා අපරදිග ජ්‍යෝතිෂ්‍යයේ මුල් අවදියේ ඉතිහාසය පිළිබඳවත් මෑතකාලීන ජ්‍යෝතිෂ්‍යයේ වර්ධනයන් සම්බන්ධයෙනුත් තොරතුරු සංක්ෂිප්තව ඇතුළත්ය.

1958 දී **The Encyclopedia Americana**[32] Vol. 2 නමින් ප්‍රකාශයට පත් ඇමරිකානු විශ්වකෝෂයෙහි ජ්‍යෝතිෂ්‍යයේ ස්වභාවයත් සෞරග්‍රහ මණ්ඩලය පිළිබඳවත්, ඊජිප්තුව, බැබිලෝනියාව ආදී රටවල්හි ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රයෙහි ඉතිහාසයත් මෑතකාලීන පර්යේෂණයන් සම්බන්ධයෙනුත් තොරතුරු සංක්ෂිප්තව ඇතුළත් වෙයි. 1968 දී පමණ රචිත **The Encyclopaedia Britanica**[33] Vol. 2 නැමැති විශ්වකෝෂයෙහි ජ්‍යෝතිෂ්‍යයේ මූලික ඉතිහාස තොරතුරුත්, ජ්‍යෝතිෂ්‍ය හා සම්බන්ධ සිතියම් පිළිබඳවත් කරුණු අන්තර්ගතය. එසේම **Jyotissatra Astral and Mathematical Literature**[34] නමින් David Pingree විසින් 1981 දී පමණ ප්‍රකාශය කළ කෘතියෙහි ජ්‍යෝතිෂ්‍යයේ මූලික ඉතිහාස තොරතුරු සම්බන්ධයෙනුත් ජ්‍යෝතිෂ්‍ය හා සම්බන්ධිත ගණිතමය කරුණු පිළිබඳවත් හැදෑරීම



සඳහා යොදාගැනීමට හැකිය. එසේම 1985 දී S. N. Sen සහ K. S. Shukla සංස්කරණය කළ **History of Astronomy in India**[35] යන ග්‍රන්ථයෙහි ද ජ්‍යෝතිෂ්‍යයේ විකාශය පිළිබඳ තොරතුරු ඇතුළත් වෙයි.

එසේම ඉහත සඳහන් කළ ග්‍රන්ථ හැර ඉපැරණි ශ්‍රී ලාංකික සංස්කෘතිය තුළ ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රීය සංකල්ප භාවිත වූ අයුරු හැදෑරීමේ දී මීට පෙර පුරාතන ශ්‍රී ලාංකික දේශපාලන, සංස්කෘතික සහ සමාජ ආදී ක්ෂේත්‍ර අළලා අධ්‍යයන කාර්යයන්හි නියැලුණු ඇම්. බී. ආරියපාල,[36] හේම එල්ලාවල,[37] විල්හෙල්ම් ගෛගර්,[38] ඇස්. පරණවිතාන,[39] ඇස්. බී. හෙට්ටිආරච්චි[40] වැනි විද්වතුන් කරන ලද පර්යේෂණයන් ද කිසියම් අයුරයකින් පිටිවහලක් කරගත හැකිය.

## ආන්තික සටහන්

1. ලෝකෝත්පත්තිය, සාංවත්සරයාගේ (ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රඥයාගේ) ලක්ෂණ සහ අගය, ආදිත්‍ය චාර, චන්ද්‍ර චාර, රාහු චාර, භෞම චාර ආදී ග්‍රහ චාර ද අගස්ත්‍ය චාර, සප්තර්ෂි චාර, කූර්ම විභාග, නක්ෂත්‍ර ව්‍යූහ, ග්‍රහ භුක්ති යෝග, ග්‍රහ යුද්ධාධ්‍යාය, චන්ද්‍ර ග්‍රහ සමාගමාධ්‍යාය, ග්‍රහ වර්ෂ ඵලාධ්‍යාය, ග්‍රහ ශෘඞ්ගාටකාධ්‍යාය, ගර්භ ලක්ෂණාදි නොයෙක් විෂයයන් පිළිබඳව සඳහන් වේ. වෘහත්සංහිතා, (වෘහත්) අනු. කේ. ඩී. කුලතිලක, නුගේගොඩ: මොඩන් පොත් සමාගම, 1969.
2. ඉරු ආදී ග්‍රහයන්ගේ ස්වරූපය, මේෂ ආදී රාශි ස්වරූපය, දෘෂ්ටි භේද, භාව පිළිබඳ තොරතුරු ඇතුළත්ය. බෘහත්පරාශර හෝරා ශාස්ත්‍රය, අනු. ඇම්. ආර්. ප්‍රනාන්දු, කොළඹ: ලේක් හවුස්හි දිනමිණ යන්ත්‍රාලය, 1943.
3. රාශි, ග්‍රහයන් සම්බන්ධවත්, මෛථුන ධර්මයේ හැසිරෙන අන්දම, ගැප් දරණ පිළිවෙල, ප්‍රසව කාල සීමාවන්, ස්ත්‍රී පුරුෂ දෙදෙනාට මරණ සිදුවෙන කාල, ගප්සාවෙන කාල, ස්ත්‍රී පුරුෂයන්ගේ පිළිසිඳ ගැනීම, නිවුන් දරුවන්ගේ උත්පත්තිය, සූතිකා ගෘහය සම්බන්ධව, අරිෂ්ට යෝග, අරිෂ්ට භඞ්ග යෝග ආදී දෑ අන්තර්ගත වේ. ලඝු ජාතකය, අනු. ඒ. ජේ. පී. පේමරාජ, මාතර: සුදර්ශන යන්ත්‍රාලය, 1929.
4. ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රයේ නොයෙකුත් මත විමසා බලා ඒවායෙහි සාරය ගෙන පණ්ඩිත පුෂ්පරාජයන් රචිත මෙහි ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රයේ මූලික තොරතුරු, ආයුර්භේද, අෂ්ටක වර්ග, දශා අන්තර් දශා ඵල, විවිධ යෝග පිළිබඳව කරුණු ඇතුළත් වේ. ශම්භුහෝරා ප්‍රකාශ, අනු. ඒ. දසනායක, නුගේගොඩ: මොඩන් පොත් සමාගම, 1970.

5. විවිධ අධ්‍යාය මඟින් නොයෙකුත් කරුණු දක්වයි. එනම් සංඥාධ්‍යාය, පිත්‍රාදරිෂ්ටාධ්‍යාය, ජාතකවිභ්නා ධ්‍යාය, අරිෂ්ටාධ්‍යාය, අරිෂ්ටභඞ්ගාධ්‍යාය, පුත්‍රභාවවිචාරාධ්‍යාය, රාජ යොගාධ්‍යාය, සාමුද්‍රිකාධ්‍යාය, ස්ත්‍රී ජාතකාධ්‍යාය, කන්‍යාඞ්ග ලක්ෂණාධ්‍යාය ආදී වශයෙනි. <u>භාවකුතුහලය</u> අනු. බී. ඇල්. සර්ණේලිස්, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1997.

6. ග්‍රහයන්, මේෂ, රාශි, භාව, දශා ආදිය පිළිබඳ තොරතුරු ඇතුළත්ය. <u>මානසාගරි,</u> අනු. කේ. ඩී. කුලතිලක, නුගේගොඩ: මොඩන් පොත් සමාගම, 1970.

7. ග්‍රහ දෘෂ්ටි, කාරක ග්‍රහයන්, නවාංශක, විවිධ යෝග, දශා සම්බන්ධව කරුණු ඇතුළත් වේ. <u>ජෛමිනි සූත්‍රය,</u> අනු. ඒ. දසනායක, නුගේගොඩ: මොඩන් පොත් සමාගම, බු. ව. 2511.

8. මූලික ජ්‍යෝතිෂ්‍ය කරුණු මෙන්ම ප්‍රශ්න ශාස්ත්‍රය, මල්වරඵල, පොරොන්දම් ආදී වැදගත් දෑ රාශියකින් යුක්තය. <u>දෛවඥකාමධෙනු,</u> (දෛවඥ) පරි. ඩී. ආර්. සෙනෙවිරත්න, නුගේගොඩ: මොඩන් පොත් සමාගම, 1989.

9. ජී. එස්. බී. සේනානායක, <u>සංස්කෘත සාහිත්‍යය,</u> කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1960, පි. 535.

10. ඒ. බෙරිඩේල් කීත්, <u>සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය,</u> කෙළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1965, පි. 799.

11. <u>එම.</u>

12. <u>එම.</u>

13. <u>එම,</u> පි. 800.

14. <u>එම.</u>

15. <u>එම.</u>

16. <u>එම.</u>

17. <u>එම.</u>

18. <u>එම.</u>

19. නැකැත් පිළිබඳව; <u>දීපවංශය,</u> (දීප) සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1970, පරි. 1, ගා. 78; පරි. 9, ගා. 32 ; පරි. 11, ගාථා. 14-15 ; පරි. 14, ගාථා. 40-41.

20. අභිෂේක චාරිත්‍ර; <u>ඌනපූරණ සහිතො මහාවංසො,</u> (ඌපූම) සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1959, පරි. 7, ගා. 71, පි. 50ත පරි. 8, ගා. 27, පි. 52ත පරි. 10, ගාථා. 77, 78. පි. 60.



21. අභිෂේකය; <u>වංසත්ථප්පකාසිනිය,</u> (වංසතථප්ප) මහාවංශ ටීකාව, සිංහල අනුවාදය, අකුරැටියේ අමරවංස හිමි සහ හේමචන්ද්‍ර දිසානායක, කැලණිය: කැලණිය විශ්වවිද්‍යාලය, 1994, පිටු. 230, 234.

22. උත්තරෝලිය නැමැති ග්‍රාමයෙහි පස් වයසැති දරුවෙකුට (පංච වස්සිකං කුමාරං) කරන ලද අකුරු කරවීමේ මංගල්‍යයක් (සික්ඛා ගහණ මංගල) පිළිබඳ, <u>රසවාහිනී,</u> (රස) (ලංකාදීපුප්පත්ති කථා) සංස්: රන්ජිත් වනරත්න, කොළඹ: සමයවර්ධන පොත්හල, 2001, පි. 176.

23. අංග ලක්ෂණ පිළිබඳව; <u>සද්ධර්ම රත්නාවලිය,</u> (සර) සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 2007, පිටු. 58, 160, 230, 592, 612, 802, 1146, 1165, 1178; බුද්ධඝෝෂ හිමියන්ගේ ධම්මපදට්ඨකථාව පදනම් කොටගෙන ධර්මසේන හිමියන් විසින් දඹදෙණි අවදියෙහි රචිත කෘතියකි. (මෙම ග්‍රන්ථය සිංහල සාහිත්‍යයේ මුදුන්මල්කඩ සේ සලකයි. හොරණ වජිරඤාණ හිමි, <u>සිංහල සාහිත්‍ය ග්‍රන්ථ ප්‍රදීපිකා,</u> කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ, 1992, පි. 139.)

24. අෂ්ටාදශ ශිල්පය, සූසැට කලා පිළිබඳව; <u>පූජාවලිය,</u> (පූජා) සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 2008, පිටු. 151, 329, 591.

25. නිමිති කීම; <u>ධම් ප්‍රදීපිකාව,</u> (ධම්ප්‍ර) සංස්. වී. ඩී. එස්. ගුණවර්ධන සමයවර්ධ න පොත්හල (පෞද්ගලික) සමාගම, 2001, පිටු. 218, 255, 256.

26. උපමා; <u>බුත්සරණ,</u> (බුත්ස) ලබුගම ලඞ්කානන්ද හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1968, පිටු. 8, 20, 37, 61, 64, 72, 252, 311, 314, 319.

27. රජු හා ජ්‍යෝතිර් විද්‍යා සංකල්ප; <u>දඹදෙණි අස්න සහ කඳවුරු සිරිත,</u> සංස්. කොන්ගස්තැන්නේ ආනන්ද හිමි, මාතර: රුහුණු විශ්වවිද්‍යාලය, 1997, පිටු. 18, 39-41, 48-50, 67, 68-69, 72.

28. "සබා තුරු ලෙසින් බොල්ලන් ගෙන නොමද
තබා පෙළින් පෙළ ඇද තිල් පලස මැද
බබා සෙද තැතින් තැන ගහ ගණන් බැඳ
පබා කර සිදත් සමහරු ගනිති ඉඳ,

<u>ගිරා සංදේශය,</u> සංස්. කේ. ජී. ජයතිලක, කොළඹ: ප්‍රදීප ප්‍රකාශකයෝ, 2006, ක. 224.

22 FEB 2016

"නල මුදු සුවඳ පිරි කුඹු මියුරු අඹ ගෙඩි
පුල හෙළ කුසුම ලිය පිය තෙපළ රන් කෙඩි
සල සුදු සෙමෙර සේසත් ගිරිඳු නොඳ වැඩි
බල සුබ නිමිති පෙරමග නැකතටත් වැඩි",

සැළලිහිණි සංදේශය, සංස්. කොළඹ: ඇපා ප්‍රකාශන, 2005, ක. 16.

29. ".....පුන්සඳ නැගැ පානා සේ ශුභ නකත් මොහොත්හි මුහුඳු පිටැ මඟ පෙතැ නිරුපද්‍රව කොටැ", "බිනෙර පුර දොළොස්වක් ලද බදා දවස් ශුභ නකත් මොහොතින් අභිෂේක කැරැ වූ.....", "Epigraphia Zeylanica" II, (EZ) ed: D. M. D. Z. Wicramasingha, London: Oxford University Press, 1928, No.5, p. 223.

30. The Panchasiddhantika, The Astronomical Works of Varaha Mihira, Ed. G. Thibaut, Lahore: The Bombay Sanskrit Press, 1930.

31. Chambers's Encyclopaedia, Vol. I, London: George Newnes Limited, 1950.

32. The Encyclopedia Americana, Vol. 2, New York: Americana Corporation, 1958.

33. The Encyclopaedia Britanica, Vol. 2, Chicargo: Willam Benton, 1968.

34. David Pingree, Jyotissastra, Astral and Mathematical Literature, Wiesbaden: Otto Harrassowits, 1981.

35. S. N. Sen and K. S. Shukla, History of Astronomy in India, New Delhi: Indian National Science Academy, 1985.

36. ඇම්. බී. ආරියපාල, මධ්‍යකාලීන ලංකා සමාජය, 13 ශතවර්ෂයට අයත් සද්ධර්මරත්නාවලියෙහි හා වෙනත් සාහිත්‍ය කෘතිවල නිරූපනය වන ලංකා සමාජයේ තත්ත්වය, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1962.

37. එච්. එල්ලාවල, පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය, කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණාලය, 1968.

38. විල්හෙල්ම් ගයිගර්, මධ්‍යකාලීන යුගයේ ලංකාවේ සංස්කෘතිය, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1969.

39. ඇස්. පරණවිතාන, "පොළොන්නරු යුගයේ සභ්‍යත්වය: දේශපාලන, අර්ථ හා සමාජ තත්ත්ව" ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසය, I, කාණ්ඩය, II භාගය, කැළණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, 1971.

40. ඇස්. බී. හෙට්ටිආරච්චි, ලංකාවේ සමාජ හා සංස්කෘතික ඉතිහාසය, මහරගම: තරංජි ප්‍රින්ට්ස්, 2008.

22 FEB 2016